**නල්ලූර් ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නල්ලූර් ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නල්ලූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | වැඩ අවසන් වූ සංවර්ධන ව්‍යාපෘති 07ක වටිනාකම රු. 3,953,398ක් ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවේ නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සභාව සතු සහ සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන19ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි. | තක්සේරු වාර්තා ලැබීමෙන් පසු වටිනාකම ගිණුම් ගත කරන බව. | -එම- |
| (ඇ) | ජංගම වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු 2023 දෙසැම්බර් 31 දිනට පැවැති රු4,788,741 ක් වූ පාරිභෝගික ද්‍රව්‍ය ශේෂය, වර්ෂයේ ලාභයට එරෙහිව ලියාහැර තිබුණි. | ඉදිරියේදී ගබඩා තොග ලෙස දක්වන බව. | -එම- |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් ණයගිම් ගිණුම් ශේෂය, සභාවේ අරමුදලින් සිදුකළ ස්ථාවර තැන්පතු ශේෂයේ හා මුදල් ශේෂයේ වර්ෂ 03කට වැඩි කාලයක සිට පවතින රු. 25,595,011ක වෙනස සැසඳීමට කටයුතු කර නොතිබුණි. | වෙනස සඳහා වූ තෙරතුරු විමර්ශනය කර ජ'නල් සටහන් මාර්ගයෙන් ගැලපීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ ප්‍රභව ලියවිලි සමග සැසඳීමට පියවර ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් වරිපනම් බදු අයවිය යුතු දේපළ 22,368කින් දේපළ 3,234ක් සඳහා K ආකෘති පත්‍ර බෙදා හැර නොතිබුණි. | දේපළ හිමිකරුවන් සොයා ගැනීමේදී පැවැති දුෂ්කරතාවන් හේතුවෙන් බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 181,776,258ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 159,759,495 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 21,051,000 | 22,665,340 | 17,530,697 | 38,235,707 | 21,053,000 | 21,381,614 | 14,239,838 | 33,101,064 |
| කුලී | 39,353,900 | 43,086,362 | 42,951,326 | 1,070,289 | 41,594,406 | 38,077,729 | 37,887,113 | 935,254 |
| බලපත්‍ර ගාස්තු | 5,549,500 | 8,388,371 | 8,433,371 | - | 6,249,000 | 5,920,125 | 5,965,125 | 45,000 |
| වෙනත් ආදායම් | 98,693,000 | 168,981,020 | 168,981,020 | 3,875,162 | 230,825,451 | 151,266,678 | 150,845,045 | 3,875,162 |
| එකතුව | **164,647,400** | **243,121,093** | **237,896,414** | **43,181,158** | **299,721,857** | **216,646,146** | **208,937,121** | **37,956,480** |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂ අවසාන දින වන විට ඉඩම් හිමියන් 16,698කින් රු.38,235,707ක ශේෂයක් අයවිය යුතුව පැවැති අතර වර්ෂයකට අධික හිඟහිටි ශේෂය රු.25,810,895ක් ව පැවැතුණි. එසේම, වර්ෂ 07ක් ඉක්මවූ කඩකාමර කුලී සහ බදුකුලී ශේෂය රු.691,489ක් හා වර්ෂ 06කට වඩා පැරණි වූ සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු. 3,875,162 ක් වී තිබුණි. | අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව. එමෙන්ම, ප්‍රසිද්ධ වෙන්දේසි කැඳවූවද, ලංසු ඉදිරිපත් කර නොතිබුණු බව. එසේම, කපා හැරීමට කටයුතු කරමින් පවතින බව. | හිඟහිටි අදායම් අයකර ගැනීමට ප්‍රශස්ත ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකායර්ක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 01ත් වර්ෂ 06ත් අතර කාලය තුළ සභාවේ සංවර්ධන සංචිත අරමුදල් මගින් ක්‍රියාත්මක කළ රු.97,840,312ක සංවර්ධන ව්‍යාපෘති 12 ක් අතරමග අත්හැර දමා තිබුණි. | වැඩසටහන් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට හෝ විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | අදාල සංවර්ධන කාර්යයන් නියමිත කාලය තුළ ඉටු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු කඩකාමර 03ක් කුලියට ලබා නොදීමෙන් සභාවට රු.3,004,759ක පමණ ආදායමක් අහිමි වී තිබුණි. | මූලික වටිනාකම අඩුකර ලංසු කැඳවා තිබූ නමුත් කිසිවෙකුත් ඉදිරිපත් නොවූ බව. | සභාවේ ආදායම් මූලාශ්‍ර මුළුමනින්ම උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | කඩ කාමර 08ක දීර්ඝකලීන බදුකුලී ගිවිසුම් වර්ෂ 03කට වරක් අළුත් කළයුතු වූවත්, වර්ෂ 02ත් වර්ෂ 18ත් අතර කාලයක් ප්‍රමාද වී තිබූ ගිවිසුම් නැවත අලුත් නොකර අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණි. | හිමිකරුවන් නොමැති හෝ සම්බන්ධ කරගත හැකි නොහැකි වීම හේතුවෙන් ගිවිසුම් අළුත්කිරීමට නොහැකිව පවතින බව. | නියමිත කාලය තුළ ගිවිසුම් අළුත් කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලා ප්‍රකාශනවල ස්ථාවර වත්කම් තුළ ඇතුළත් රු.53,450,000ක ඉඩම් 17ක් සභාව නමින් නොපැවැතුණි. | පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | සභාව සතු වත්කම් නිරවුල් කරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ප්‍රකාරව ඇස්තෙමින්තු ගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේදි ආදායම් විෂයන් 04ක සියයට 51ක සිට සියයට 135ක් දක්වාත්, වැය විෂයන් 06ක සියයට 12ක සිට සියයට 93ක් දක්වාත්, එක් මූලධන විෂයක සියයට 22ක විචලනයන් පැවැතීම හේතුවෙන් අයවැය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | ඉදිරියේදී එම අඩුපාඩු නිවැරදි කර තාත්ත්වික අයවැයක් සැකසීමට නියමිත බව. | අවශ්‍යතා හඳුනාගෙන සැලැකිලිමත් ලෙස අයවැය සකස් කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගත් ප්‍රදේශයේ මදුරුවන් බෝවීම මධ්‍යනයට මැසි තෙල් ඉසීම හා දුරගන්ධය නැති කිරීමට සුදුසු ක්‍රියාමාර්ග පසුගිය වර්ෂ 02ක කාලයක සිට ගෙන නොතිබුණි. | ඉදිරියේදී සිදුකෙරෙන බව. | පරිසරයට හිතකාමී අයුරින් කසල බැහැර කළ යුතුය. |